④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1588/17 - 2009 පෙබරවාරි 11 වැනි බදාදා - 2009.02.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

2002 මැයි මස 08 වැනි දිනැති අංක 1235/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලැබූ 2002.05.08 දින දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 6 ඡේදයෙහි, iii උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් නව උපඡේදය ආදේශ කරනු ලැබේ.

> "6 (iii) අදාල තනතුරු වෙනුවෙන් අයදුම්කරුවන්ගේ විෂයානුබද්ධ දැනුම මැන බැලීම සඳහා දෙවැනි උපලේඛනයේ දෙවැනි පත්‍රය යටතේ නියම කර ඇති ප්‍රශ්ණ පත්‍රයට ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව උපරිම අනු පිළිවෙල අනුව වෙන වෙනම පෙළගස්වා ලැයිස්තු ගත කරන අතර එකී ලකුණු සංඛ්‍යාවේ හා පොදු ප්‍රශ්ණ පත්‍රයට ලබා ගන්නා ලකුණු සංඛ්‍යාවේ එකතුවෙහි අනු පිළිවෙල පදනම් කර ගනිමින් අයදුම්පතේ සඳහන් මනාපයන් ද සැලකිල්ලට ගෙන, නියමිත සෑම ප්‍රශ්ණ පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපෙක්ෂකයින් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ."

ජේ. රංජිත් විජේතිලක,<br>
ලේකම්,<br>
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය.

2009 පෙබරවාරි මස 10 වැනි දින,<br>
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය,<br>
"ගොවිජන මන්දිරය "<br>
80/5, රජමල්වත්ත පටුමග,<br>
බත්තරමුල්ල.

02-607